සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

# පළමු වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2017
# First Term Test - Grade 06 - 2017

නම : ............................................... ගණිතය කාලය: පැය 02 යි.

## I කොටස

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(1) නිවැරදි පිළිතුර ලැබෙන සේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) $27 \times 10 =$ ..................

(ii) $4500 \div 100 =$ ..................

(2) ගණක රාමුවෙන් නිරූපණය වන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියා දක්වන්න.




(3) 7, 12, 17, 22, .........., .......... මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

(4) < සහ > යන සංකේතවලින් සුදුසු සංකේතය තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) 8 ...........2

(ii) -5 ........... 5

(5) අගය සොයන්න.

27 + 145

(6) සවස් වරුවේ වේලාවක් මෙසේ ඔරලෝසු මුහුණතක සටහන් වී ඇත. මෙම වෙලාව



(i) පැය 12 ක්‍රමයට ලියන්න. .................................

(ii) සම්මත ක්‍රමයට ලියන්න. .................................

(7) 2500$ml$ ලීටර් හා මිලි ලීටර් වලින් ලියන්න

......................$l$......................$ml$

---

(8) අලුත් අවුරුදු දිනය 2017 අප්‍රේල් 14 වෙනිදාය. මෙම දිනය අන්තර් ජාතික සම්මත ක්‍රමයට දක්වන්න.

---

(9) දෙසිය තිස්පත් බිලියන විසිහතර දහස් අටසිය හතලිස් දෙක, සම්මත ආකාරයට ලියා දක්වන්න.

---

(10) 5, 0, -3, 8 යන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

---

(11) දී ඇති රූපයේ $\frac{1}{5}$ ක කොටසක් අඳුරු කර දක්වන්න.



---

(12) සුළු කරන්න. $\frac{2}{7} + \frac{1}{7}$

---

(13) ඝනකයක ඇති දාර ගණන හා මුහුණත් ගණන ලියන්න.

(i) දාර ..................................... (ii) මුහුණත් .....................................

---

(14) පහත සංඛ්‍යා ආසන්න දහයේ ගුණාකාරයට වටයා ලියන්න.

(i) 43 - ..............................

(ii) 75 - ..............................

---

(15) තිරස් හා සිරස් බව තහවුරු කිරීම සඳහා වඩාත් සුදුසු උපකරණය වරහන් තුළින් තෝරා ලියන්න.
(මට්ටම් ලීය, ලඹය, මිනුම් පටිය, මුළු මට්ටම, ස්ප්‍රීතු ලෙවලය)

(i) සිරස් බව දැන ගැනීමට ..............................................................................................

(ii) තිරස් බව දැන ගැනීමට ..............................................................................................

---

(16) ටොපි 231ක්, එක් අයකුට 3 බැගින් බෙදීමේදී ළමුන් කී දෙනෙකුට ප්‍රමාණවත්ද?

---

(17) ඔරලෝසුවක පැය හා මිනිත්තු කටු අතර සෘජුකෝණයක් සාදන වේලාවන් 2 ක් පැය 12 ක්‍රමයට ලියා දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

---

(18) රූපයේ දක්වෙන්නේ මිතුරන් දෙදෙනකු දිශා ඇසුරින් සකසාගත් විනෝද ක්‍රීඩාවට යොදාගත් කාඩ්පතක් ස්ථානගත කර ඇති ආකාරයයි.

(i) A හි ඇති ඉත්තා උතුරට කොටු 3ක් හා නැගෙනහිරට කොටු 3ක් ගිය විට පිහිටීම B ලෙස ලකුණු කරන්න.

(ii) A හි ඇති ඉත්තා කොටු 4 ක් ඊසානට ගොස් කොටු 3ක් දකුණට ගියවිට පිහිටීම C ලෙස ලකුණු කරන්න.




---

(19) 625 = (100 × .........) + (........ × 2) + (1 × 5) හිස් කොටු සඳහා සුදුසු අගයයන් ලියන්න.

---

(20) කොළඹ කොටුවෙන් 18:00 පිටත් වූ දුම්රියක් 02:00 ට හැටන් දුම්රිය ස්ථානයට ළඟාවිය. දුම්රිය ගමනට ගත වූ කාලය පැය කීයද?

---

## II කොටස

පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4 කටත් මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

(1) (a) ශිෂ්‍යයෙකු විසින් වෘත්ත රටාවක් ඇඳීමේදී කරන ලද පියවර කීපයක් පහත දැක්වේ. එම පියවර a, b, c,d ලෙස නම්කර ඇත්තේ අනුපිළිවෙලට නොවේ.

(a) 

(b) 

(c) 

(d) 

(i) මෙම ක්‍රියාකාරකම කළයුතු නිවැරදි අනුපිළිවෙල අනුව ඉංග්‍රීසි අක්ෂර පෙළගස්වන්න.

..........................................................................................................................

(ii) මෙම ක්‍රියාකාරකමේදී වෘත්ත හා සරල රේඛා ඇඳීමට යොදාගත හැකි ද්‍රව්‍ය තුනක් ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

(b) (i) දී ඇති පිහිටීම වෘත්තය ඇතුළත/මත/පිටත පිහිටීම ලෙස හඳුනාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.




A - ................

B - ..................

C - ..................

To download past papers visit
www.vajirapani.blogspot.com

(ii) නිවසේදී ඔබට දැකිය හැකි වෘත්තාකාර හැඩය සහිත ද්‍රව්‍ය 2ක් ලියන්න.

..........................................................................................................................

(iii) ගෝලාකාර දොඩම් ගෙඩියක් හරිමැදින් වෙන් වන සේ කැපූවිට වෘත්තාකාර මුහුණත් කීයක් දක්නට ලැබේද? ..........................................................................................

(iv) වෘත්ත රටා යොදාගනිමින් කරනු ලබන නිර්මාණ සඳහා උදාහරණ තුනක් ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

(2) (a) පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ඒකස්ථානයේ ඉලක්කම | දසස්ථානයේ ඉලක්කම | සියස්ථානයේ ඉලක්කම | ඒකස්ථානයේ ඉලක්කමෙන් නිරූපිත අගය | දසස්ථානයේ ඉලක්කමෙන් නිරූපිත අගය | සියස්ථානයේ ඉලක්කමෙන් නිරූපිත අගය |
|---|---|---|---|---|---|---|
| 437 | 7 | (a) .......... | 4 | (b) .......... | 30 | 400 |
| (c) .......... | 2 | 1 | (d) .......... | (e) .......... | (f) .......... | 500 |
| 999 | (g) .......... | 9 | (h) .......... | 9 | (i) .......... | (j) .......... |

(b) (i) 47982014 යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න. ..........................................................................

(ii) එම සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

.............................................................................................................

.............................................................................................................

(iii) ඉහත සංඛ්‍යාවේ 2 න් නිරූපනය වන අගය 1 නිරූපනය වන අගය මෙන් කී ගුණයක් ද? ..............

---

(3) (a) (i) හිස් කොටුවලට ගැලපෙන ඉලක්කම ලියන්න.

```
  4□58
- 2963
------
  10□5
======
```

(ii) දීර්ඝ බෙදීමේ ක්‍රමයෙන්
(a) ලබ්ධිය ............
(b) ශේෂය .............. සොයන්න.

13 | 1394

(b) මහජන සෞඛ්‍ය නිලධාරී මහතා පාසලේ 7 ශ්‍රේණියේ ළමුන් වෙනුවෙන් ලබාදුන් විටමින් පෙති අඩංගු බෝතලයක පෙති 750 ක් තිබුණි.

(i) එවැනි බෝතල් 15 ක් අඩංගු පෙට්ටියක ඇති පෙති ගණන සොයන්න.

.............................................................................................................

(ii) එක් සිසුවකුට පෙති 9 බැගින් ලබාදේ නම් එම පෙට්ටියේ අඩංගු බෙහෙත් තොගය සිසුන් කී දෙනෙකුට ප්‍රමාණවත් ද? ..............................................................

.............................................................................................................

---

(4) (a) 6 ශ්‍රේණියේ ළමුන් සඳහා ක්‍රියාත්මක දැලිස වැඩසටහනක පළමු දිනයේ පෙරවරු 8 පසු වී මිනිත්තු 12 ට ආරම්භ කර මිනිත්තු 7 යි තත්පර 24 ක් ගතවූ පසු, ජගත් එය අවසන් කරන ලදී. ජගත් එය අවසන් කළ වේලාව සම්මත ආකාරයට ලියන්න. ..............................................................

To download past papers visit
www.vajirapani.blogspot.com

(b) සමාන කාලයන් යා කරන්න.

| | | |
|---|---|---|
| (i) | තත්පර 120 | පැය 1 මිනිත්තු 40 |
| (ii) | මිනිත්තු 100 | පැය 72 |
| (iii) | දින 3 | මිනිත්තු 300 |
| (iv) | පැය 5 | මිනිත්තු 75 |
| (v) | පැය 1 මිනිත්තු 15 | මිනිත්තු 2 |

(c) සුළු කරන්න.

(i)

| මිනිත්තු | තත්පර |
|---|---|
| 6 | 12 |
| - 3 | 20 |
| | |

(ii)

| දින | පැය |
|---|---|
| 2 | 12 |
| + 3 | 12 |
| | |

---

(5) (a) (i) එදිනෙදා මිනුම් යෙදෙන අවස්ථා දෙකක් ලියන්න. ..............................................................

.............................................................................................................




(ii) අල්පෙනෙත්තේ දිග 3cm නම් පැන්සලේ දිග සඳහා වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(a) 12cm (b) 15cm (c) 9cm (d) 18cm

(b) (i) සුනිල්ගේ ස්කන්ධය 44kg කි. නිමල්ගේ ස්කන්ධය 35kg වේ. දෙදෙනාගේ ස්කන්ධ ආසන්න දහයේ ගුණාකාරයට වටයන්න. ..............................................................

.............................................................................................................

(ii) දෙදෙනාගේ ස්කන්ධ අතර වෙනස සොයන්න. ..............................................................

(c) ශාලාවක ඇති පුටු ගණන ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට අගය 60 කි.

(i) අඩුම පුටු ගණන කීයද? ..................................................................

(ii) වැඩිම පුටු ගණන කීයද?..................................................................

(iii) ශාලාවෙන් පුටු 9ක් ඉවත්කර ඉතිරි පුටු ගණන ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විටද අගය 60ක් නම් ශාලාවේ මුලින් තිබූ පුටු ගණන කීයද? ..................................................................

---

(6) (a) සිරිමල් ළඟ ඇති මකනය, පෑන සහ පැන්සල හි දිග මැනීමෙන් ලබාගත් මිනුම් පහත දැක්වේ.

මකනය - 5cm    පෑන - 15cm    පැන්සල - 12cm

(i) ඉහත මිනුම් දී ඇති සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න.




(ii) සංඛ්‍යා රේඛාව ඇසුරින් එම එක් එක් ද්‍රව්‍යයේ දිග සංසන්දනය කිරීමට වරහන් තුළ ඇති සංකේත යොදාගන්න. (<, =, >)

මකනයේ දිග ...................... පැන්සලේ දිග

පෑනේ දිග ......................... මකනයේ දිග

To download past papers visit
www.vajirapani.blogspot.com

(b) (i) -5 සිට 5 තෙක් පහත රේඛාව අංකනය කරන්න.



(ii) 0, -2, 1, -4, 3 යන නිඛිල ඉහත සංඛ්‍යා රේඛාව මත නිරූපනය කරන්න.

(iii) 0, -2, 1, -4, 3 යන් නිඛිල ආරෝහන පිළිවෙලින් ලියා දක්වන්න.

..................................................................................................

---

(7) පහත දැක්වෙන්නේ සරඹ සංදර්ශනයක් සඳහා ශිෂ්‍යාවන් පිරිසක් ස්ථානගත කිරීම සඳහා යෙදූ සැලැස්මකි.

(a) රූපයේ ලකුණු කර ඇති කෝණ හඳුනාගනිමින් නිවැරදිව යා කරන්න.

| | | |
|---|---|---|
| (i) | සුළු කෝණය | (x) |
| (ii) | මහා කෝණය | (r) |
| (iii) | සරල කෝණය | (p) |
| (iv) | ඍජු කෝණය | (y) |
| (v) | පරාවර්ත කෝණය | (q) |




(b) A සිට I තෙක් නම්කර ඇත්තේ ශිෂ්‍යාවන් නම්,

(i) Aට දකුණින් සිටින දෙදෙනා කවුද? ..................................................................

(ii) A ට තිරිත දෙසින් සිටින්නේ කවුද? ..................................................................

(iii) G සිටින්නේ H ට කුමන දිශාවෙන්ද?..................................................................

(iii) C සිටින්නේ H ට කුමන දිශාවෙන්ද?..................................................................

(c) උතුරු දිශාව සමග ඍජුකෝණයක් සාදන දිශාවන් දෙක නම් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## පළමු වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2017

## First Term Test - Grade 06 - 2017

### ගණිතය - පිළිතුරු පත්‍රය

### I කොටස

(1) (i) 270 ---------- 1
(ii) 45 ---------- 1 -- 2

(2) 935 ---------- 2

(3) 27, 32 ---------- 1+1

(4) (i) > ---------- 1
(ii) < ---------- 1 -- 2

(5) 172 ---------- 2

(6) (i) පෙ. ව. 3.30 ---------- 1
(ii) 15 : 30 ---------- 1 -- 2

(7) (i) *21 500ml* ---------- 2

(8) 2017- 04 -14 ---------- 2

(9) 235 000 024 842 ---------- 2

(10) -3, 0, 5, 8 ---------- 2

(11)  ---------- 2

To download past papers visit www.vajirapani.blogspot.com

(12) $\frac{3}{7}$ ---------- 2

(13) (i) 12 ---------- 1
(ii) 6 ---------- 1 -- 2

(14) (i) 40 ---------- 1
(ii) 80 ---------- 1 -- 2

(15) (i) ලම්බය ---------- 1
(ii) ස්ප්‍රිතු ලෙවලය ---------- 1 -- 2

(16) 3 න් බෙදීමට ---------- 1
7/ ---------- 1 -- 2

(17) පෙ. ව. 3.00 / පෙ. ව. 9.00/ප. ව. 3.00 / ප. ව. 9.00
(ඕනෑම පිළිතුරු යුගලයකට) ---------- 2

(18) නිවැරදි ලකුණු කිරීම් සඳහා ---------- 2

(19) 6, 10 ---------- 2

(20) පැය 8 ---------- 2

### II කොටස

(1) (a) (i) b, a, d, c ---------- 3
(ii) ද්‍රව්‍ය 3ක් සඳහා ---------- 3

(b) (i) A - මත
B -ඇතුලත
C - පිටත ---------- 3
(ii) ද්‍රව්‍ය 2ට ---------- 2
(iii) 2 ---------- 2
(iv) උදාහරණ 3ට ---------- 3

---------- 16

(2) (a) (i) නිවැරදි පිළිතුරු සඳහා (1/2 × 10) ---------- 5
(b) (i) 47 982 014 ---------- 2
(ii) පිළිතුරට ---------- 2
(iii) 200 ---------- 2

---------- 11

(3) (a) (i) 0 හා 9 සඳහා ---------- 2
(ii) බෙදීමට ---------- 2
ලබ්ධිය 107 ---------- 1
ශේෂය 3 ---------- 1
(b) (i) 11250 ---------- 3
(ii) 1250 ---------- 2

---------- 11

## II කොටස

(4) (a) 08:19:24 ---------- 2

(b) නිවැරදි යා කිරීම සඳහා ---------- 5

(c) (i) මී. 2 ත. 52 ---------- 2

(ii) දින 6 ---------- 2

---------- 11

(5) (a) (i) අවස්ථා 20 ---------- 2

(ii) 15cm ---------- 2

(b) (i) සුනිල් 40

නිමල් 40 ---------- 2

(ii) 9kg ---------- 1

(c) (i) 55 ---------- 1

(ii) 64 ---------- 1

(iii) 64 ---------- 2

---------- 11

To download past papers visit
www.vajirapani.blogspot.com

(6) (a) (i) 5, 15, 12 නිරූපනය කිරීමට හා නම් කිරීමට ---- 3

(ii) පිළිතුරට ---------- 2

(b) (iii) නිවැරදි අංකනයට ---------- 2

(ii) නිවැරදි නිරූපනයට ---------- 2

(iii) -4, -2, 0. 1, 3 ---------- 2

---------- 11

(7) (a) නිවැරදි යා කිරීමට ---------- 5

(b) (i) D,H ---------- 1

(ii) C ---------- 1

(iii) බටහිරින් ---------- 1

(iv) වයඹ ---------- 1

(c) නැගෙනහිර, බටහිර ---------- 2

---------- 11